**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2013**

**-----------------------------------------------**

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 10(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාර සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු එකී පනතේ 10(4) වගන්තියෙහි සඳහන් අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ මාගේ වාර්තාව පහත සඳහන් ඡේදයන්හිද, ආදායම් හා වියදම් ප්‍රකාශනය ඇමුණුම් අංක 1 ලෙසද, අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම් අංක 2 ලෙසද දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ ගැලපුම්, රු.239,596 ක් අතීතානුයෝගී ලෙස ගැලපීම් කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 12 වන විට පිරිවැය රු.1,972,152 ක්වූ Dengue Igm Elisa 96 වර්ගයේ කට්ටල 52 ක් ඉතිරිව පැවති අතර, ඉන් 33 ක් 2014 ඔක්තෝබර් 30 දින කල් ඉකුත්ව තිබුණු අතර, ඉතිරි කට්ටල 2014 දෙසැම්බර් 23 දින කල් ඉකුත් වීමට නියමිතව තිබුණි. එසේ වුවද ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතිය සඳහා Viral Extraction කට්ටල 10 ක් 2013 මාර්තු 14 දින මිලදී ගෙන තිබුණු අතර වටිනාකම රු. 435,000 ක් වූ කට්ටල 05 ක් භෞතික පරීක්ෂාව සිදු කරන ලද 2014 අගෝස්තු 22 දින ඉතිරිවී තිබුණි. එම තොගය 2013 සැප්තැම්බර් මාසයේදී කල් ඉකුත් වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) වටිනාකම රු. 242,500 ක් වූ Thermo Read TM Tag DNA Pd Ymer 1000 y වර්ගයේ Vials 25 ක් 2013 මාර්තු 14 දින මිලදී ගෙන තිබු අතර 2014 අගෝස්තු 22 දින වන විට රු. 232,800 ක් වටිනාකමැති Vials 24 ක ශේෂයක් නිශ්කාර්යව පැවති අතර එදින වන විට ඒවා කල් ඉකුත්වී තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි අවසන් නොකිරීම හේතුවෙන් අවලංගු කරනු ලැබූ කොන්ත්‍රාත්තුවකට අදාළව රක්ෂණ සමාගමෙන් ලැබිය යුතු රු.1,372,346 ක කාර්යසාධන සුරක්ෂණ ඇපකරය වර්ෂ 6 ක කාලයක් ගතවී ඇතත් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------<br>(අ) මුදල් රෙගුලාසි 751 | ඩෙංගු ව්‍යාපෘතියට අදාළ රසායනාගාරයට සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.20,036,550 ක් වටිනා ද්‍රව්‍ය වෙනුවෙන් රසායනාගාරයෙහි ලේඛනගත කිරීම් සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 756 | සියලුම දෙපාර්තමේන්තුවල භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකල යුතු වුවද, විශාල වටිනාකමකින් යුතු මිලදී ගැනීම් පවතින ඩෙංගු ව්‍යාපෘතියට අදාළ රසායනාගාරයෙහි එසේ වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් වූ ඌනතාවය රු.46,900,783 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.102,502,994 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.149,403,777 ක පහත වැටීමක් සිදු වී තිබූ අතර ඒ සඳහා සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් රු.193,284,550 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 අරමුදලෙහි සංයුතිය

ලොතරැයි ආදායම සහ පොළී ආදායම් වලින් සමන්විත පොදු අරමුදලෙහි වූ රු. 172,006,888 කින්ද, දේශීය වශයෙන් ලද පරිත්‍යාග මුදල් වූ රු. 108,159,078 කින්ද, සෘජුවම අරමුදල වෙත ලැබෙන විදේශීය පරිත්‍යාග මුදල් වූ රු. 65,473,802 කින්ද අරමුදල සංයුක්ත වී තිබුණි. අරමුදලට විදේශාධාර වශයෙන් ලැබූ මුදල් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනයෙහි විදේශාධාර වශයෙන් වෙනම දක්වා හෝ හෙළිදරව් කර හෝ නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2004 වර්ෂයේදී ද සොයිසා කාන්තා රෝහලේ සංවර්ධන කටයුතු සඳහා අරමුදලක් පිහිටුවා තිබුණු අතර, එමගින් රෝහලේ ඉතා පැරණි ගොඩනැගිලි නවීකරණය කිරීම හා නඩත්තු කිරීම අරමුණු කර තිබුණි. එසේ වුවද 2004 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වාත් මෙමගින් පින්තාරු කිරීම් සහ ජනෙල් තිර රෙදි දැමීම වැනි සුළු කාර්යයන් පමණක් සිදු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලෙහි ශේෂය රු. 1,647,495 ක් වී තිබුණි. ඒ අනුව ඉහත අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අරමුදල වර්ධනය කර ගැනීමටද පියවර ගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

(ආ) කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට හෘද චිකිත්සාගාරයක් ඉදි කිරීම සඳහා රැස් කරන මහජනාධාර, සෞඛ්‍ය සංවර්ධන අරමුදල යටතේ ගිණුම්ගත කිරීමට අරමුදල් භාරකාර මණ්ඩලය 2005 වර්ෂයේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2005 වසරේ සිට 2008 වර්ෂය දක්වා විවිධ පරිත්‍යාගශීලින් වෙතින් රු.947,101 ක මුදලක් රැස්කර තිබුණද, 2008 වර්ෂයෙන් පසු 2013 දෙසැම්බර් 31 දින දක්වා මුදල් කිසිවක් ලැබී නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ගන්නා සෙබළුන්ට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාගැනීම සඳහා අරමුදල වෙත රු.10,000,000 ක් පරිත්‍යාග කර තිබුණි. එම පරිත්‍යාග මුදලින් සියයට 58.51 ක් හෙවත් රු.5,850,888 ක ශේෂයක් එම කාර්යයට යෙදවීමකින් තොරව 2013 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලේ රඳවාගෙන තිබුණි.

4.2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

2013 වර්ෂයේදී වකුගඩු රෝගීන් වෙනුවෙන් සායන පැවැත්වීම සඳහා රු.783,200 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර දරන ලද තථ්‍ය වියදම රු. 545,614 ක් විය. එම වියදමින් රු. 376,780 ක් එනම් සියයට 69 ක්ම ප්‍රවාහන වියදම් සඳහා දරා තිබුණි. තවද ප්‍රවාහන පහසුකම් ලබාගත් ආයතනයෙන් පිළිගතහැකි බිල්පත්ද ඉදිරිපත් කර නොතිබුණි.

4.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

Dengue Igm Elisa 96 වර්ගයේ කට්ටල 120 ක් බැගින් රු. 4,551,220 ක් වැය කර 2012 හා 2013 වර්ෂවලදී මිලදී ගෙන තිබුණි. කට්ටලයකින් පරීක්ෂණ 96 ක් සිදු කරනු ලබන අතර 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් පරීක්ෂණ 1,026 ක් හා 1,098 ක් වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් සිදු කර තිබුණි. ඒ අනුව 2012 හා 2013 වර්ෂ සඳහා Igm Elisa කට්ටල 23 ක පමණ අවශ්‍යතාවක් සඳහා රු.4,551,220 ක් වැය කර එම වර්ගයෙන් කට්ටල 120 ක් මිල දී ගැනීමෙන් අතිරික්ත මිලදී ගැනීම් සිදු කර ඇති බැව් නිරීක්ෂණය විය.

4.4 **<u>අරමුදල් ඌන උපයෝජනය</u>**

අරමුදලේ සමස්ථ වත්කම් වූ රු. මිලියන 372 න් රු.මිලියන 312 ක්ම කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබුණි. අරමුදලෙහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවධානය යොමු නොකර දිගින් දිගටම ආයෝජන ලෙස මෙම මුදල් රඳවා තිබෙන බැව් නිරීක්ෂණය විය.

4.5 **<u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

ඉදිකිරීම් හා නඩත්තු කාර්යයන් 05 ක් වෙනුවෙන් ලැබී තිබු එකතුව රු.6,711,979 ක මුදලක් වර්ෂ 07 සිට වර්ෂ 26 කට අධික කාල පරාසයක් තුළ අදාළ කාර්යයන් ඉටු කිරීමකින් තොරව මුළු මුදලම නිෂ්කාර්යව පැවතුණි.

4.6 **<u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

ජාතික රුධිර පාරවිලයන සේවය මගින් පවත්වන ලද අධ්‍යයන වැඩමුළුවක් සඳහා ඉදිරිපත් කර තිබු වැඩසටහනට අනුව වැඩමුළුවට 159 දෙනෙකු පැමිණේයැයි අපේක්ෂා කර තිබුණද 122 දෙනෙකු පමණක් සහභාගි වී තිබුණි. එදින වැඩමුළුවට සහභාගී වන නිලධාරීන් පිළිබඳ කලින් තහවුරු කර ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 200 දෙනෙකු සඳහා ආහාර සැපයීම වෙනුවෙන් රු. 124,410 ක් වැඩිපුර වැයකර තිබුණි.

4.7 **<u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ 11 වන මහල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ කාර්යාල පරිශ්‍රයක් පිහිටුවීම සඳහා සකස් කිරීමට සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් ප්‍රතිපාදන දැරීමට තීරණය කර තිබුණි. එම කාර්යය වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් රු.3,202,797 ක බදු ඇතුළත්ව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව 2013 ඔක්තෝබර් 11 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ මාස 3 කින් නිම කළ යුතුව තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපියේ V ඡේදය ප්‍රකාරව අදාළ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ii) යථෝක්ත ලිපියේ III ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වලංගු කාලසීමාව කිසිදු ආකාරයකින් දීර්ඝ නොකරන බවත්, කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත කාලය තුල අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ප්‍රමාදවන කාලය සම්බන්ධයෙන් ගිවිසුමේ ප්‍රකාරව ප්‍රමාද ගාස්තුවක් අයකලයුතු බවත් දක්වා තිබුණි. කොන්ත්‍රාත්තුවේ වැඩ 2014 ජනවාරි 20 දින වන විට අවසන් විය යුතුව තිබුණද, වැඩ අවසන්කර තිබුණේ 2014 පෙබරවාරි 20 දිනදී වුවද විධිමත් ගිවිසුමක් නොවූයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii). අවසන් බිල්පත සමඟ ඉදිරිපත් කරන ලද උප ලේඛනයේ අංක 1 යටතේ මූලික වැඩ කොටස් (Preliminaries) ලෙස රු.111,058 ක වැඩ වටිනාකමක් දක්වා තිබුණද ඒ යටතේ කරන ලද වැඩ කොටස් කවරේද යන්න විගණනයට තහවුරු නොවීය.

(iv). අවසන් බිල්පතෙහි කල වැඩ වටිනාකම ලෙස රු. 2,452,522 ක් දක්වා තිබුණද එම වැඩ වටිනාකම තහවුරු කිරීමට ප්‍රමාණවත් ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද විස්තරාත්මක වැඩ විස්තරයක් හා මැනුම් පත්‍ර අවසන් බිල්පත සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල සායන මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමට අදාළව වසරක නඩත්තු කාලසීමාව අවසන් වී තිබුණු බැවින් සියයට 5 ක රඳවුම් මුදල වූ රු. 2,682,715 නිදහස් කරන ලෙස උපදේශක කාර්යාංශය ඉල්ලීමක් කර තිබුණි.

බොහොමයක් මධ්‍යස්ථානවල අඩුපාඩු පැවති බවට 2012 පෙබරවාරි 27 දිනැති වාරක පරීක්ෂණ වාර්තාවෙන් වාර්තා කර තිබුණි. ඒ අනුව 2012 අගෝස්තු 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරුවරයා වෙත මෙම සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් කේෂත්‍ර පරීක්ෂණයක් සිදු කොට ඒ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, එකී ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීද සහභාගී කරවාගත යුතු බවටද නියම කර තිබුණි. ඒ අනුව මධ්‍යස්ථාන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයීය සිවිල් ඉංජිනේරුවරයා විසින් 2014 සැප්තැම්බර් 10 දින වාර්තාවක් නිකුත් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i). තීරණයට එළඹී දින සිට අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමට වර්ෂ 2 ක් ගතවී තිබුණද එහි අඩුපාඩු පැවති මධ්‍යස්ථාන කවරේද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ii). අදාළ කේෂත්‍ර පරීක්ෂණය සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහභාගී වී ඇති බවට සනාථන සාක්ෂි තහවුරු නොවුණි.

(ඇ) ඇතාවැටුනවැව සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. 5,334,273 ක වටිනාකමට ප්‍රදානය කර තිබුණු අතර නිම කල යුතු දිනය 2013 ජූලි 27 දින ලෙස ගිවිසුමේ දක්වා තිබුණි. 2013 සැප්තැම්බර් 27 දින දක්වා දින දීර්ඝ කිරීම සිදුකර තිබුණු නමුත් විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 31 දින වනවිටත් ඉදිකිරීම් නිම කර භාරදුන් බවට වාර්තා කර නොතිබුණි.

## 5. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් අරමුදල විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පොදු අරමුදලෙහි සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් තිබියදීත් අදාළ අරමුණු ඉටු කරගැනීම සඳහා විධිමත්ව සඵලදායී ලෙස යෙදවීමක් නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. පසුගිය වර්ෂ කීපයක දෙසැම්බර් 31 දිනට පොදු අරමුදලෙහි පැවති අරමුදල් ශේෂය පහත පරිදි විය.

| වර්ෂය | අරමුදලේ ශේෂය |
|---|---|
| | රු. |
| 2013 | 172,006,888 |
| 2012 | 178,932,521 |
| 2011 | 110,895,505 |
| 2010 | 130,814,586 |

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලෙහි ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් පිළිබඳව සැලකීමේදී අක්ෂි බැංකු ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. 16,500,000 වූ අතර තථ්‍ය වියදම රු.24,246,000 ක් වුයෙන් තථ්‍ය අගය සියයට 46 කින් වැඩි වී තිබුණු අතර වාහන අළුත්වැඩියා සඳහා රු. 100,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුළදී වියදම් කිසිවක් දරා නොතිබුණි.

## 6. පද්ධති සහ පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිගේ අවධානයට යොමු කරවන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) අත්තිකාරම්

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ගබඩා පාලනය

ඇමුණුම 01

ආදායම් හා වියදම් ප්‍රකාශනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | |
| ජාතික සම්පත ලොතරැයි ආදායම | 61,357,280 | | 52,560,260 | |
| පරිත්‍යාග | 162,998,913 | | 155,139,494 | |
| ආයෝජන පොලී | 35,699,162 | | 30,538,493 | |
| අනිකුත් ආදායම් | 33,244,203 | | 9,878,521 | |
| | | 293,299,558 | | 248,116,768 |
| වියදම | | | | |
| පරිපාලන වියදම් | 2,004,795 | | 1,597,636 | |
| මූල්‍ය හා අනෙකුත් වියදම් | 24,150 | | 16,420 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 338,410,992 | | 145,126,441 | |
| | | 340,439,937 | | 146,740,497 |
| ඌනතාවය/ අතිරික්තය | | (47,140,379) | | 101,376,271 |
| පෙර වර්ෂ ගැලපුම් | | 239,596 | | 1,126,723 |
| | | (46,900,783) | | 102,502,994 |

ඇමුණුම 02

<u>ආයෝජන ප්‍රකාශනය</u>

<u>ස්ථාවර තැන්පත් - මහජන බැංකුව</u>

| සහතිකයේ අංකය | ආයෝජනය කල දිනය | ආයෝජන කාලය | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2013 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2013 වර්ෂයේ ආපසු ගැනීම් | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ---------- | ------------ | --------- | ---------------- | ------------ | ------------- | ------------------- |
| | | | රු. | රු. | රු. | රු. |
| 865632 | 2012/12/21 | මාස 3 | 63,000,000 | - | - | 63,000,000 |
| 865633 | 2012/12/21 | මාස 3 | 23,000,000 | - | - | 23,000,000 |
| 865615 | 2012/12/12 | මාස 3 | 20,000,000 | - | - | 20,000,000 |
| 865614 | 2012/12/12 | මාස 3 | 20,000,000 | | | 20,000,000 |
| 865616 | 2012/11/30 | මාස 3 | 15,000,000 | - | - | 15,000,000 |
| 331414 | 2012/12/27 | මාස 3 | 1,500,000 | - | - | 1,500,000 |
| 379711 | 2012/03/14 | අවු: 1 | 10,000,000 | - | - | 10,000,000 |
| 865606 | 2013/06/05 | මාස 3 | - | 50,000,000 | - | 50,000,000 |
| 865627 | 2013/12/21 | මාස 3 | - | 35,000,000 | - | 35,000,000 |
| - | 2013/04/17 | මාස 6 | - | 11,000,000 | 11,000,000 | - |
| | | | 152,500,000 | 96,000,000 | 11,000,000 | 237,500,000 |

භාණ්ඩාගාර බිල්පත්

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2013 වර්ෂය තුළ ආයෝජනය | 2013 වර්ෂය තුළ ආපසු ගැනීම | 2013දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 2010100226 | 2012/10/04 | 91 | 6,244,852 | - | 6,834,947 | - |
| 20101006221 | 2012/06/08 | 357 | 19,592,146 | - | 19,592,146 | - |
| 2010060157 | 2012/06/08 | 357 | 3,569,408 | - | 3,569,408 | - |
| | | | 29,406,406 | | 29,996,501 | |

ලංකා බැංකුව

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2013 වර්ෂය තුළ ආයෝජනය | 2013 වර්ෂය තුළ ආපසු ගැනීම | 2013දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 314 | 2013/03/08 | 350 | 14,388,333 | - | - | 15,863,144 |
| 314 | 2013/12/27 | 182 | 4,721,435 | - | - | 4,816,955 |
| 314 | 2013/05/17 | 91 | 23,505,905 | - | 23,612,346 | - |
| 314 | 2013/05/24 | 182 | 7,556,080 | - | 7,629,944 | - |
| 314 | 2013/03/01 | 182 | 5,883,461 | - | 5,966,168 | - |
| 314 | 2012/08/31 | 364 | 11,475,942 | - | 11,475,942 | - |
| 314 | 2013/10/04 | 161 | 39,425,005 | - | - | 40,038,124 |
| M10B-022269 | 2013/01/07 | 07 | 20,000,000 | - | 20,000,000 | - |
| M13B-026845 | 2013/12/30 | 04 | - | 5,000,000 | - | 5,000,000 |
| M13B-026303 | 2013/12/20 | 13 | - | 9,000,000 | - | 9,000,000 |
| | | | 126,956,161 | 14,000,000 | 68,684,400 | 74,718,223 |
| | | | 156,362,567 | 14,000,000 | 98,680,901 | 74,718,223 |